**කොච්චිකඩේ පාලම යළි ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2018.**

**---------------------------------------------------------------**

කොච්චිකඩේ පාලම යළි ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරනු ලැබීය.මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා රෙයිෆසන් ජාත්‍යන්තර බැංකුව ඒජී අතර 2016 ජනවාරි 13 දින එළඹී ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරනවා.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------**

ණය ගිවිසුම අනුව එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. වයාපෘතියේ අරමුණ වනුයේ කොච්චිකාඩ් පිහිටි පාලම ප්‍රතිස්ථාපනය කිරීමයි.එය පැලියගොඩ පුත්තලම සම්බන්ධ කරන මාර්ගයේ යටිතල පහසුකම් අඛණ්ඩව පවත්වා ගැනීමට ප්‍රමාණවත් දායකත්වයක් ලබා දීම සඳහා මාර්ගයේ රථ වාහන ප්‍රමාණය දරා ගැනමට ව්‍යුහාත්මකව දුර්වල හා යෝග්‍ය නොවේ.ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1735.62 කට සමාන යුරෝ මිලියන 10.85 ක් වූ අතර එඉන් රු. මිලියන1392 කට සමාන යුරෝ මිලියන 8.70 ක් මූල්‍යයනය කිරීම සඳහා ඔස්ට්‍රියාවේ රෙයිෆසන් ජාත්‍යන්තර බැංකුව ඒජී එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 ජූලි 24 දින ආරම්භ කර 2019 ජනවාරි 24 දිනට නිම කිරීමට අපේක්ෂා කරන ලදි.

## 1.3 මතය

**------**

මාගේ වාර්තාවේ 2 වගුවේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**-------------------**

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ

පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම පාලනය සම්බන්ධයෙන් චෝදනා ලද අය සතුවේ.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාරතා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමණානාරණයේ අදහස් දැක්ම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරු හට ගෙවිය යුතු රුපියල් මිලියන 32 ක මුදලක් ගිණුම්වලට ගෙන නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස කෙරීගෙන යන වැඩ ගිණුමේ සහ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ගිණුමේ වටිනාකම එම ප්‍රමාණයෙන්ම අඩු වී ඇත. | කෙරීගෙන යන වැඩ සහ වගකීම අඩුවෙන් තක්සේරු වීම. | 2018 දෙසැම්බර් සිට 2019 ජනවාරි දක්වා කාලයට අදාල රුපියල් මිලියන 32 ක වටිනාකමකින් යුතු කළ වැඩ 2019 වර්ෂයේදී ගිණුම්ගත කර ඇත . | මූල්‍ය ප්‍රකාශණ පිළයෙල කිරීමේදී වර්ෂ අවසානයට ගෙවිය යුතු වටිනාකම් සලකා බැලීම අවශය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කටයුතුවල භෞතික කාර්ය සාධනය

---

2016 ජුලි 24 වන දින ආරම්භ කරන ලද පාලමේ ඉදිකිරීම් වැඩ අවසන් කර නියමිත දිනය වූ 2019 ජනවාරි 24 දිනට පෙර එනම් 2019 ජනවාරි 11 වන දින ක්‍රියාත්මක කිරීමේ ආයතනයට භාර දී ඇති බව නිරීක්ෂණය විය.